(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක **47.** ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025** අප්‍රේල් **08** අඟහරුවාදා පූ.භා. **9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **විජිත හේරත් මහතා,** විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂණ සූරියප්පෙරුම මහතා,** මුදල් සහ ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **නීතිඥ සාගරිකා අතාවුද මහත්මිය**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා

ගරු මංජුල සුරවීර ආරච්චි මහතා

ගරු (ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය

ගරු බී. ආරියවංශ මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු අර්කම් ඉල්යාස් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා

ගරු ඔෂානි උමංගා මහත්මිය

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු වසන්ත පුෂ්ප කුමාර මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු නිලූෂා ලක්මාලි ගමගේ මහත්මිය

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු ගයාන් ජනක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු එම්. ඒ. එම්. තාහිර් මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු තනුර දිසානායක මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා

ගරු තිළිණ සමරකෝන් මහතා

ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා

ගරු අම්බිකා සාමුවෙල් මෙනෙවිය

ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා

ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා

ගරු දේවානන්ද සුරවීර මහතා

ගරු චන්දන සූරියආරච්චි මහතා

ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා

ගරු අරවින්ද සෙනරත් මහතා

ගරු කිට්නන් සෙල්වරාජ් මහතා

ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා

ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා

ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා

ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා

ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය

ගරු දිනේෂ් හේමන්ත මහතා

ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය

ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා

ගරු මුහම්මද් ෆයිසාල් මහතා

ගරු රියාස් ෆාරුක් මහතා

චමින්ද කුලරත්න මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ:** ජනාධිපතිවරයාගෙන් ලද මතු පළවන සංදේශය නියෝජ්‍ය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/7/1X/3/01

2025 මාර්තු මස 28 වන දින

ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**2. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2025 මාර්තු 21 දින ගරු කථානායකවරයා විසින් 'විසර්ජන' නමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දන්වනු කැමැත්තෙමි."

II

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද 'එකතු කළ අගය මත බදු (සංශෝධන)' නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය ගරු කථානායකවරයා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම්දීමට කැමැත්තෙමි.

රජයේ පාර්ශ්වය විසින් ලබා දුන් ප්‍රතිඥාව සැලකිල්ලට ගනිමින් S.C. (SD) 05/2025 සහ S.C. (SD) 06/2025 යන පෙත්සම් ඉදිරිපත් කරන ලද පෙත්සම්කරුවන් විසින් එම පෙත්සම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරගෙන නොයෑමට තීරණය කර ඇති බැවින්, අදාළ පනත් කෙටුම්පතේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව අධිකරණය විසින් තීන්දුවක් ලබා නොදුන් බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දැනුම් දී තිබේ.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි."

III

"කෑගල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කෝසල නුවන් ජයවීර මහතා මියයාම හේතුකොට ගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 66(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2025 අප්‍රේල් 06 දින සිට මෙම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

එතුමාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කණගාටුවෙනි. මේ පිළිබඳව අප දැඩිසේ කණගාටු වන අතර මෙම ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව පාර්ලිමේන්තුව වෙනුවෙන් මම දන්වනු කැමැත්තෙමි.

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත."

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) නියෝජ්‍ය කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LVII කොටස සහ නවවැනි කාණ්ඩයේ XLIV කොටස;

(ii) 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LX කොටස; සහ

(iii) 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXIX කොටස සහ නවවැනි කාණ්ඩයේ XXII කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් —

(i) 2023 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්;

(ii) 2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2023 වර්ෂය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iv) 2023 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2023 වර්ෂය සඳහා පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය විසින් 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මාර්තු 24 දිනැති අංක 2429/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ඉදිරිපත් කර, එම යෝජනා ක්‍රමය රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(12) කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යවරිය විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය සහ ඒ යටතේ එවකට පැවති ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(13) බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (i) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(ii) රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(iii) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) තංගල්ල, සිටිනාමළුව යන ලිපිනයෙහි පදිංචි බර්ටි කුමාරප්පෙරුම මහතාගෙන් ලැබුණු 2025.01.08 දිනැති පෙත්සම;

(ii) අම්බලන්තොට, මාමඩල, බැමිණියන්විල, කපුගම ගෙදර යන ලිපිනයෙහි පදිංචි ඩී.ඒ. කොඩිතුවක්කු මහතාගෙන් ලැබුණු 2024.11.22 දිනැති පෙත්සම;

(iii) බෙලිඅත්ත, නිහිලුව, 'රුසිරු' යන ලිපිනයෙහි පදිංචි එච්. කේ. සුනිල් මහතාගෙන් ලැබුණු 2025.01.29 දිනැති පෙත්සම;

(iv) රන්න, කහඳාව, රූකව පාර, අංක 151/1 දරන ස්ථානයෙහි පදිංචි එච්. ටී. ඒ. තිලකසිරි මහතාගෙන් ලැබුණු 2025.01.24 දිනැති පෙත්සම;

(v) හකුරුවෙල, ගජනායකගම, ඉත්ත දෙමලියෙ ගෙදර යන ලිපිනයෙහි පදිංචි එම්. ජේමවතී මහත්මියගෙන් ලැබුණු 2025.02.05 දිනැති පෙත්සම;

(vi) තිස්සමහාරාම, දකුණ රණකෙළිය, පුස්තෝල්මුල්ල යන ලිපිනයෙහි පදිංචි සරත් කුමාර වන්නි ආරච්චි මහතාගෙන් ලැබුණු 2025.01.07 දිනැති පෙත්සම; සහ

(vii) අම්බලන්තොට, බැරගම, ගල්වැව, අංක 248/2 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්. රූපිකා මහත්මියගෙන් ලැබුණු 2025.02.06 දිනැති පෙත්සම

ගරු නිහාල් ගලප්පත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) පානදුර, නිර්මල මාවත, අංක 5/4 ඒ 1/2 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. දිසානායක මහතාගෙන් ලැබුණු 2025.02.11 දිනැති පෙත්සම ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(3) දෙණියාය, කොළවෙණිගම, පල්ලේගම, බඹරගොඩ යන ලිපිනයෙහි පදිංචි කේ. ඒ. නදුනි අහිංසා මහත්මියගෙන් ලැබුණු 2025.01.31 දිනැති පෙත්සම ගරු ලාල් ප්‍රේමනාත් මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන):** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 මැයි 08 බ්‍රහස්පතින්දා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. අපරාධයකින් උත්පාදිත දේ පිළිබඳ පනත් කෙටුම්පත:** දෙවැනිවර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනිවර කියවිය යුතු ය"යි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

"ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.14 ට ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 5.09 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය" යි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේ දී)

නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තියේ සිට 151 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය

"ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතු ය"යැයි යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

"පනත් කෙටුම්පත දැන් තුන්වැනිවර කියවිය යුතු ය"යැයි අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව, තුන්වැනිවර කියවා සභා සම්මත කරන ලදී.

**9. අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය:** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 ජනවාරි 08 දිනැති අංක 2418/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.03.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 5 වගන්තිය සමඟ කියවිය යුතු 3(ඇ) සහ 3(ඉ) වගන්ති ප්‍රකාරව විෂමාචාරය සහ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් මහතා පොලිස්පති ධුරයෙන් ඉවත් කිරීම සඳහා එකී පනතෙහි 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට වූ යෝජනා සම්මතය:** ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, ගරු ගයාන් ජනක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— පොලිස්පති ටී. එම්. ඩබ්ලිව්. දේශබන්දු තෙන්නකෝන් (මෙහි මින් මතු දේශබන්දු තෙන්නකෝන් ලෙස හඳුන්වනු ලබන) එක් කාල වකවානුවක දී බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස කටයුතු කළ හෙයින් ද;

එකී දේශබන්දු තෙන්නකෝන් හිටපු ජනාධිපතිවරයා විසින් 2023-11-21 දින හෝ ඊට ආසන්න දිනකදී වැඩ බලන පොලිස්පති ලෙස පත් කරන ලද හෙයින් ද;

හිටපු ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ඔහුව පොලිස්පති වශයෙන් පත්කිරීම අනුමත කර ඇති බව ප්‍රකාශ කරමින් එකී දේශබන්දු තෙන්නකෝන් ඉන් අනතුරුව, 2024-02-26 වන දින සිට බලාත්මක වන පරිදි පොලිස්පති ලෙස පත් කරන ලද හෙයින්ද;

දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස එසේ පත්කිරීම අංක: SC FR 67/2024, SC FR 68/2024, SC FR 71/2024, SC FR 72/2024, SC FR 75/2024, SC FR 79/2024, SC FR 80/2024, SC FR 82/2024 හා SC FR 84/2024 දරන මූලික අයිතිවාසිකම් පෙත්සම් නවයක් මඟින් පුරවැසියන් කිහිප දෙනෙකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේදී අභියෝගයට ලක් කර ඇති හෙයින්ද;

එකී දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති වශයෙන් පත්කිරීමේ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න කරමින් ප්‍රබල බැලූ බැල්මට පෙනෙන නඩුවක් ඉහත සඳහන් පෙත්සම්කරුවන් විසින් ගොනු කර ඇති පදනම මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉහත කී මූලික අයිතිවාසිකම් අයිතීන් පෙත්සම් ඉදිරියට ගෙන යාමේ අවසරය පෙත්සම්කරුවන් වෙත ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, එකී අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති සියලු තොරතුරු හා සාක්ෂි සමස්තයක් ලෙස සැලකිල්ලට ගනිමින්, එහි 2024-07-24 දිනැති නියමය මඟින් තීරණය කර ඇති බැවින් හා එකී නියමය හරහා එකී පත්වීම ව්‍යවස්ථාවෙහි අදාළ ප්‍රතිපාදනවලට පටහැනි බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රතියමාන කරන හෙයින්ද;

එකී පෙත්සම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද එකී ප්‍රබල බැලූ බැල්මට පෙනෙන නඩුව සැලකිල්ලට ගෙන ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී දේශබන්දු තෙන්නකෝන් විසින් පොලිස්පති ධුරයේ බලතල, කාර්යයන් හා වගකීම් දැරීම වළක්වාලමින්, එකී නඩු සඳහා අවසන් තීන්දු ලබා දෙන තෙක් වලංගුවන පරිදි අතුරු නියෝගයක් නිකුත් කිරීමට තීරණය කර ඇති හෙයින්ද;

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිකුත් කරන ලද එකී නියමයට අනුකූලව ජනාධිපතිවරයා විසින් ඉන් අනතුරුව පොලිස්පති ධුරයේ බලතල, කාර්යයන් හා වගකීම් ඉටුකිරීම සඳහා වැඩ බලන පොලිස්පතිවරයෙකු පත් කර ඇති හෙයින්ද;

එකී දේශබන්දු තෙන්නකෝන් විසින් පහත සවිස්තරාත්මකව දක්වා ඇති විෂමාචාර ක්‍රියා හා සිය ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීම සම්බන්ධ සිද්ධීන්වල යෙදී ඇති බැවින් පොලිස්පති ධුරය දැරීමට නුසුදුසු තැනැත්තෙකු බවට මේ වනවිට අනාවරණය වී ඇති හෙයින්ද:—

1. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් නම් වශයෙන්; ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලෙම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලීප් ගිහාන් පියතිස්ස යන සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

2. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් නම් වශයෙන්; ප්‍රධාන පොලිස් පරීක්ෂක අන්ස්ලෙම් ද සිල්වා, පොලිස් පරීක්ෂක මහේෂ් රුවන් දුනුසිංහ, පොලිස් පරීක්ෂක ජගත් නිශාන්ත, උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග, පොලිස් සැරයන් 69480 ප්‍රසාන්ත කුමාර, පොලිස් සැරයන් 57241 මනින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර, පොලිස් කොස්තාපල් 2204 සුපුන් ප්‍රියශාන්, පොලිස් කොස්තාපල් රියදුරු 89728 දුලීප් ගිහාන් පියතිස්ස යන අයගෙන් සමන්විත එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යැවීමට නීති විරෝධී ලෙස කටයුතු කර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින්ද;

3. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක නියැලීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින්ද;

4. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, පොලිසියට අයත් WP PK 7225 දරන රථය භාවිත කරමින් කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමක් රහසිගත ලෙස වැලිගම, පැලැන වෙත යාමට හා ඔවුන්ට නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක නියැලීමට පහසුකම් සැපයීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින්ද;

5. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති හෙයින් ද;

6. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදවීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීමට නීති විරෝධී ලෙස යොදවා ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3 (ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

7. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

8. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එකී සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායම නීති විරෝධී කටයුත්තක හෝ අපරාධයක යෙදී ඇති බව, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලය වෙත රහසිගත ලෙස වෙඩි ප්‍රහාර එල්ල කිරීම ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතෙහි 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින් ද;

9. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරින් කණ්ඩායමේ දෙදෙනෙකු වන පොලිස් සැරයන් 57241 මානින්ගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන අය වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

10. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නියැලෙන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි එකී බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස දේශබන්දු තෙන්නකෝන් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගැනීමට අපොහොසත් වූ අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදුකර ඇති හෙයින් ද;

11. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරත වන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ළඟම ඇති රෝහලට තුවාලකරුවන් රැගෙන නොගොස් රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

12. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, කොළඹ අපරාධ කොට්ඨාශයේ පොලිස් සැරයන් 57241 මානිංගමුව ගෙදර උපුල් චමින්ද කුමාර සහ උප පොලිස් පරීක්ෂක රොෂාන් මධුරංග යන සන්නද්ධ පොලිස් නිලධාරින් දෙදෙනෙකු වැලිගම, පැලැනේදී ඉහත සඳහන් නීති විරෝධී ක්‍රියාවක හෝ අපරාධයක නිරත වන අතරතුර වෙඩි වැදී තුවාල ලබා ඇති බව ඉතා හොඳින් දැනසිටි බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, ළඟම ඇති රෝහලට තුවාලකරුවන් රැගෙන නොගොස් රහසිගතව කොළඹ බලා ආපසු යන ලෙස එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින්ට උපදෙස් දී ඇති අතර, එමඟින්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

13. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

14. බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරින්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධ වීමට පහසුකම් සැලසීම, එනම් වැලිගම, පැලැනේ පිහිටි W 15 හෝටලයට වෙඩි තැබීමට ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

15. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

16. 2023-12-30 දින හෝ ඊට ආසන්න දිනකදී, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ වැඩ බලන පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, කොළඹ අපරාධ කොට්ඨාශයට අයත් එම සන්නද්ධ පොලිස් නිලධාරීන්ගේ කණ්ඩායමේ අනෙකුත් සාමාජිකයින් සමඟ කුමන්ත්‍රණය කර, ඔවුන් නීති විරෝධී ක්‍රියාකාරකමකට හෝ අපරාධයකට සම්බන්ධවීමට පහසුකම් සැලසීම, එනම්, වැලිගම, පැලෑන වෙත යාම සඳහා ඔවුන්ට ආධාර සහ අනුබල දීමෙන් සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

17. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව, විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

18. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේ වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්හි අණ පිළි නොගනිමින් සැඟවී සිටීම සහ එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

19. 2025-02-27 දින සිට 2025-03-19 දින දක්වා කාලසීමාව තුළ දේශබන්දු තෙන්නකෝන් පොලිස්පති ලෙස කටයුතු කරමින් සිටියදී 2025-02-27 දින අංක B R 6314/2023 දරන නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් සිදු කරන ලද නියෝග සහ එම නඩුවේදී මාතර ගරු මහෙස්ත්‍රාත්වරයා විසින් වරින් වර නිකුත් කරන ලද වරෙන්තු නිකුත් කිරීම ඇතුළු අනෙකුත් ආනුෂංගික නියෝගයන්ට අනුකූලවීමට අපොහොසත් වී ඇති බවත්, සිදුවෙමින් පවතින නිසි නෛතික ක්‍රියාවලියට හානි

කරමින් සැඟවී සිටි බවත්; නීතියේ ආධිපත්‍යය, යුක්තිය සහ නීතිය ක්‍රියාත්මක කිරීම ආරක්ෂා කිරීමේ කාර්යය පවරා ඇති පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රතිරූපයට සහ කීර්ති නාමයට කැළලක් සිදු කළ බවත්; සමස්තයක් ලෙස පොලිස් දෙපාර්තමේන්තුව සහ අධිකරණ පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වූ බවත්, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව, විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන පොලිස්පති ධුරයට අයෝග්‍ය සහ නුසුදුසු ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

20. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන් විසින්, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනියමාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පීරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දුලිප් ප්‍රනාන්දු, කහඳගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත් නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේශ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද;

21. 2022-05-09 දින බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස එකී දේශබන්දු තෙන්නකෝන්, MC Fort නඩු අංක B 22046/2022 හි සැකකරුවන් වන නම් වශයෙන් ලියනාරච්චිගේ නිශාන්ත මෙන්ඩිස්, සුදුවදේවගේ සුභාෂ් ජයශාන්ත ප්‍රනාන්දු, සිංහාර අමල් පුෂ්පකුමාර ද සිල්වා, විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක, කුරුගමගේ සනත් නිශාන්ත පෙරේරා, ලියනගේ අබේරත්න සුරේෂ් ප්‍රියසාත් නොහොත් ඩෑන් ප්‍රියසාත්, වන්නක්කුවඩුගේ සමන්ලාල් ප්‍රනාන්දු, ගම්ලත් ජයන්ත රෝහණ, ලියනගේ ගීතක පෙරේරා, ජයමාන්න කංකානම්ලාගේ බන්දුල විජේකුමාර, පුෂ්පලාල් කුමාරසිරි, අමිතානන්ද අබේවික්‍රම, කොම්පන්නාගේ මිණි ප්‍රශාන්ති ෆොන්සේකා නොහොත් වැල්ලේ රමණී, අසංක නායක විජේසිංහ නොහොත් සතා නාලක හෙවත් අරාබි වසන්ත, කැස්පලාගේ දොන් අරුණ ප්‍රියශාන්ත, අජන්තා ලියනගේ, ගෝනියමාලිගේ සුපෙම්සිරි අපොන්සු, සමරක්කොඩි ජයලත් වසන්තා සරෝජිනී ජයලත් නොහොත් හඳපාංගොඩ, තෙල්ගේ ආරියදාස පීරිස්, කීරිගම පමුණුවගේ නරේන්ද්‍ර දුලිප් ප්‍රනාන්දු, කහඳගමගේ මහින්දරත්න, නිශාන්ත චාමින් උපතිස්ස ජයසිංහ, ජොන්ස්ටන් ප්‍රනාන්දු, කුරුප්පුආරච්චිගේ දොන් සජිත් සාරංග, රණබාහු මුදියන්සේලාගේ තුසිත සම්පත්

නානායක්කාර, හොරණගේ ප්‍රදීප් ශ්‍රියන්ත ප්‍රනාන්දු, ලියනගේ ශානක ඇන්ටනි ප්‍රනාන්දු, මහවත්තගේ ප්‍රියනාත් මැකෙන්සි ප්‍රනාන්දු, බබිනා හැන්නදිගේ ගයාන් පුෂ්පකුමාර පීරිස්, කපුවත්තගෙදර ප්‍රගීත් සුජීව බණ්ඩාර, කුරුප්පු මුදියන්සේලාගේ ලලිත් උදේෂ් මධුභානු යන ඇතැම් පුද්ගලයින් විසින්, දණ්ඩ නීති සංග්‍රහයේ 314, 316, 343 සහ 300 වැනි වගන්ති යටතේ දඬුවම් ලැබිය හැකි වරද සිදුකිරීම වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමට අපොහොසත්ව හෝ පැහැර හැර ඇති අතර, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3 (ඉ) වගන්තිය ප්‍රකාරව, ඔහුගේ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමක් සිදු කර ඇති හෙයින් ද;

22. එකී දේශබන්දු තෙන්නකෝන්, මුළු රටේම නීතිය හා සාමය පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇති රටේ පොලිස්පති ලෙස ධුරය දරමින් සිටියදී, ඉහත සඳහන් කළ විෂමාචාර ක්‍රියා එකක් හෝ කිහිපයක් සහ/හෝ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවන් සිදු කිරීමෙන් රටේ පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව අපකීර්තියට පත් කිරීම සහ එමඟින් පොලිස්පතිට නොගැලපෙන ක්‍රියාවක් සිදු කිරීමෙන්, 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති හෙයින් ද; සහ

23. එකී දේශබන්දු තෙන්නකෝන්, රටේ පොලිස්පති ලෙස ධුරය දරන අතරතුර, විවිධ ස්වභාවයේ පුළුල් බලතල සහිතව, ඉහත සඳහන් කළ විෂමාචාර ක්‍රියා එකක් හෝ කිහිපයක් සිදු කිරීමෙන් සහ/හෝ ධුරයේ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස භාවිත කිරීමේ ක්‍රියාවන් සිදු කිරීමෙන්, එමඟින් 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 3(ඇ) වගන්තිය ප්‍රකාරව විෂමාචාර ක්‍රියාවක් ලෙස සැලකෙන, රටේ පොලිස්පති ධුරය දරන තැනැත්තෙකුගෙන් අපේක්ෂා කරන උසස් ප්‍රමිතියට අනුකූල නොවීමෙන්, රටේ පොලිස්පති ධුරය දැරීමට නුසුදුසු බවට පත්ව ඇති හෙයින් ද,

යුක්තිය පසිඳලීමේ සමස්ත පද්ධතියේ ස්වාධීනත්වය සහ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ආරෝපණය කරනු ලැබූ වගකීම ඉටු කරනු ලැබිය යුතු වන හෙයින් සාධාරණ හා නිදහස් සමාජයක් නිර්මාණය කිරීමේ සහ සංරක්ෂණය කිරීමේ කාර්යය පැවරෙන ප්‍රාථමික නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්ගෙන් එකක් ලෙස පොලිස්පති ධුරය සහ පොලිස් දෙපාර්තමේන්තුව කෙරෙහි මේ රටේ ජනතාව තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම සඳහා, ඉහත සඳහන් විෂමාචාර ක්‍රියා සහ/හෝ බලතල බරපතල අන්දමින් අනිසි ලෙස යොදා ගැනීමේ ක්‍රියාවන් සම්බන්ධයෙන් විමර්ශනය කර එහි සොයාගැනීම් වාර්තා කිරීම සඳහා 2002 අංක 5 දරන නිලධරයන් ඉවත් කිරීමේ (කාර්ය පටිපාටිය) පනතේ 5 වගන්තිය ප්‍රකාරව පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

ප්‍රශ්නය විමසන ලදින්, පාර්ලිමේන්තුව මතු පළවන අන්දමට පක්ෂව 151; විරුද්ධව 0; යනුවෙන් බෙදී, එය සභා සම්මත විය.

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ආ) අනුකූලව විද්‍යුත් ඡන්ද විමසීම් ක්‍රමය භාවිතයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකසිය හතළිස්අටදෙනෙකු (148) පහත සඳහන් ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| G 001. K.V. Samantha Viddyarathna | Yes |
| G 002. Sunil Handunnetti | Yes |
| G 003. K.D. Lal Kantha | Yes |
| G 004. Vijitha Herath | Yes |
| G 005. Nalinda Jayathissa | Yes |
| G 006. Bimal Rathnayake | Yes |
| G 007. Harini Amarasuriya | Yes |
| G 010. Wasantha Samarasinghe | Yes |
| G 011. A.H.M.H. Abayarathna | Yes |
| G 012. Chrishantha Abeysena | Yes |
| G 013. Anil Jayantha | Yes |
| G 014. Harshana Nanayakkara | Yes |
| G 016. Saroja Savithri Paulraj | Yes |
| G 017. Ananda Wijepala | Yes |
| G 018. Hiniduma Sunil Senevi | Yes |
| G 019. Sunil Kumara Gamage | Yes |
| G 020. Kumara Jayakody | Yes |
| G 022. Anura Karunathilaka | Yes |
| G 023. Upali Pannilage | Yes |
| G 024. Nihal Galappaththi | Yes |
| G 025. Nihal Abeysinghe | Yes |
| G 026. Namal Karunaratne | Yes |
| G 027. Wasantha Piyathissa | Yes |
| G 028. Gamagedara Dissanayake | Yes |
| G 029. R.M. Jayawardhana | Yes |
| G 031. Rathna Gamage | Yes |
| G 032. Mahinda Jayasinghe | Yes |

| | |
|---|---|
| G 033. Chathuranga Abeysinghe | Yes |
| G 034. Eranga Gunasekara | Yes |
| G 037. Nalin Hewage | Yes |
| G 038. Prasanna Gunasena | Yes |
| G 039. Anton Jayakody | Yes |
| G 040. Sundaralingam Pradeep | Yes |
| G 041. Hemali Weerasekara | Yes |
| G 042. Ruwan Ranasinghe | Yes |
| G 043. Muneer Mulaffer | Yes |
| G 044. Susil Ranasinghe | Yes |
| G 046. Eranga Weeraratne | Yes |
| G 047. Namal Sudarshana | Yes |
| G 048. P. Ruwan Senarath | Yes |
| G 049. Madhura Senevirathna | Yes |
| G 050. Arun Hemachandra | Yes |
| G 051. Janitha Ruwan Kodithuwakku | Yes |
| G 052. Aruna Jayasekera | Yes |
| G 053. Sugath Thilakaratne | Yes |
| G 054. Harshana Suriyapperuma | Yes |
| G 055. Ashoka Ranwala | Yes |
| G 057. R.M. Gamini Rathnayake | Yes |
| G 058. Manjula Suraweera Arachchi | Yes |
| G 060. Shantha Pathma Kumara Subasingha | Yes |
| G 061. Samanmali Gunasingha | Yes |
| G 062. Gayan Janaka | Yes |
| G 063. Ajith Agalakada | Yes |
| G 064. Sagarika Athauda | Yes |
| G 065. Roshan Akmeemana | Yes |
| G 066. U. P. Abeywickrama | Yes |

| | |
|---|---|
| G 067. L.M. Abeywickrama | Yes |
| G 068. M.K.M. Aslam | Yes |
| G 069. Kaushalya Ariyarathne | Yes |
| G 070. Asitha Niroshana Egoda Vithana | Yes |
| G 071. Arkam Ilyas | Yes |
| G 072. Oshani Umanga | Yes |
| G 073. Krishnan Kalaichelvi | Yes |
| G 075. Wasantha Pushpa Kumara | Yes |
| G 076. Chaminda Lalith Kumara | Yes |
| G 077. Sarath Kumara | Yes |
| G 078. Nilanthi Kottahachchi | Yes |
| G 079. M.A.C.S. Chathuri Gangani | Yes |
| G 081. Thilanka U. Gamage | Yes |
| G 082. Nilusha Lakmali Gamage | Yes |
| G 083. Ajantha Gammeddage | Yes |
| G 084. Ajith Gihan | Yes |
| G 085. Jagath Gunawardana | Yes |
| G 086. Ashoka Gunasena | Yes |
| G 087. Ruwanthilaka Jayakody | Yes |
| G 089. Thushari Jayasingha | Yes |
| G 090. T.K. Jayasundara | Yes |
| G 091. Mayilvaganam Jegatheeswaran | Yes |
| G 092. Rajeevan Jeyachandramoorthy | Yes |
| G 093. Sellaththamby Thilaganathan | Yes |
| G 096. Thanura Dissanayake | Yes |
| G 097. Sugath Wasantha de Silva | Yes |
| G 098. Dharmapriya Dissanayake | Yes |
| G 099. Sujeewa Dissanayake | Yes |
| G 101. Susantha Kumara Nawarathna | Yes |

| | |
|---|---|
| G 102. Sena Nanayakkara | Yes |
| G 103. Nandana Pathmakumara | Yes |
| G 104. Aruna Panagoda | Yes |
| G 105. Nimal Palihena | Yes |
| G 106. Nishantha Perera | Yes |
| G 107. Stepni Fernando | Yes |
| G 108. Kanthasamy Prabu | Yes |
| G 109. Lal Premanath | Yes |
| G 111. Padmasiri Bandara | Yes |
| G 112. Ravindra Bandara | Yes |
| G 113. Sudath Balagalla | Yes |
| G 114. Sri Bavanandarajah | Yes |
| G 115. E. M. Basnayaka | Yes |
| G 116. Wijesiri Basnayake | Yes |
| O 016. Ramanathan Archchuna | Yes |
| O 023. Ajith P. Perera | Yes |
| O 039. Kaveenthiran Kodeeswaran | Yes |
| O 040. Gnanamuththu Srineshan | Yes |
| O 042. Mujibur Rahman | Yes |
| O 057. M.S. Uthumalebbe | Yes |
| O 064. Nissam Kariyappar | Yes |
| O 065. Sunil Biyanwila | Yes |
| O 066. S. Sandaruwan Madarasinghe | Yes |
| O 067. Prageeth Madhuranga | Yes |
| O 068. Jagath Manuwarna | Yes |
| O 069. Ruwan Mapalagama | Yes |
| O 070. Nandana Millagala | Yes |
| O 071. Riyas Farook | Yes |
| O 072. Danushka Ranganath | Yes |

| | |
|---|---|
| O 079. Elayathamby Srinath | Yes |
| O 080. Pathmanathan Sathiyalingam | Yes |
| O 081. Sanjeewa Ranasingha | Yes |
| O 082. Sunil Rathnasiri | Yes |
| O 083. Manjula Sugath Rathnayaka | Yes |
| O 084. A.M.M.M. Rathwaththe | Yes |
| O 085. Manoj Rajapaksha | Yes |
| O 087. Hasara Liyanage | Yes |
| O 088. Deepthi Wasalage | Yes |
| O 089. Kanchana Welipitiya | Yes |
| O 090. R. G. Wijerathna | Yes |
| O 091. Nishantha Samaraweera | Yes |
| O 092. Priyantha Wijerathna | Yes |
| O 093. Ruwan Wijeweera | Yes |
| O 094. Darmapriya Wijesinghe | Yes |
| O 095. Hiruni Wijesinghe | Yes |
| O 096. Athula Welandagoda | Yes |
| O 097. Fasmin Sharif | Yes |
| O 098. Dinindu Saman | Yes |
| O 100. Ambika Samivel | Yes |
| O 102. Chandana Sooriyaarachchi | Yes |
| O 103. Sooriyabandara | Yes |
| O 104. Aravinda Senarath | Yes |
| O 105. Kitnan Selvaraj | Yes |
| O 106. Janaka Senarathna | Yes |
| O 107. Chandima Hettiaratchi | Yes |
| O 108. Champika Hettiarachchi | Yes |
| O 109. Dinesh Hemantha | Yes |
| O 110. Geetha Herath | Yes |

| | |
|---|---|
| O 111. Bhagya Sri Herath | Yes |
| O 112. Muhammad Faizal | Yes |
| O 113. Aboobucker Athambawa | Yes |
| O 114. Najith Indika | Yes |
| O 115. Lakmali Hemachandra | Yes |

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 47(2)(ඇ) අනුකූලව පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරිය විසින් පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තිදෙනෙකු (3) නම් විමසීමෙන් පහත ආකාරයට ඡන්දය ප්‍රකාශ කරන ලදී:—

| | |
|---|---|
| Sunil Rajapaksha | Yes |
| T. B. Sarath | Yes |
| Thilina Samarakoon | Yes |

**11. කල් තැබීම:** එකල්හි වේලාව අ.භා. 5.30 පසුකර තිබූයෙන් අ.භා. 5.57ට නියෝජ්‍ය කථානායකවරයා විසින්, අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 අප්‍රේල් 09 බදාදා පූ.භා. 9.30 වනතෙක් කල් ගියේ ය.